# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2184/33 - 2020 ජූලි මස 16 වැනි බ්‍රහස්පතින්දා - 2020.07.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ, 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර නාගරික සංවර්ධන, ජල සම්පාදන හා නිවාස පහසුකම් අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මම, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ, දැදුරුඔය ජල සම්පාදන ව්‍යාපෘතියේ, පොල්පිතිගම ජල කුළුණ ඉදි කිරීම සඳහා ඉඩම් කොටසක් අවශ්‍යව ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසෙහි නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මෙම නියමයෙන් අනුමත කරමි.

**මහින්ද රාජපක්ෂ,**
නාගරික සංවර්ධන, ජල සම්පාදන හා නිවාස පහසුකම් අමාත්‍ය.

2020 ජූලි මස 08 වැනි දින,
බත්තරමුල්ල,
පැලවත්ත,
නව පාර්ලිමේන්තු පාර,
අංක 35 හි පිහිටි,
නාගරික සංවර්ධන, ජල සම්පාදන හා නිවාස පහසුකම් අමාත්‍යාංශයේ දී ය.
5/2/3/1532

**උපලේඛනය**

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 354, පොල්පිතිගම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, ගලපිටගම ගමේ පිහිටි, බලයලත් මිනින්දෝරු ජේ. එම්. එන්. බණ්ඩාර මහතා විසින් මැන සකස් කරන ලද අංක 383/2017 දරන මිනින්දෝරු සැලැස්මේ කැබලි අංක 01 වශයෙන් දැක්වෙන "පන්සල්වත්ත" නමැති ඉඩමෙන් පහත සඳහන් මායිම තුළ පිහිටි පර්චස් 40ක් පමණ වන ඉඩම් කොටස :

*කැබලි අංක* : 01
*ඉඩමේ නම* : පන්සල්වත්ත
*ප්‍රමාණය* : පර්චස් 40

මායිම්

*උතුරට* : පොල්පිතිගම සිට නාගොල්ල විහාරය දක්වා දිවෙන ප්‍රාදේශීය සභා මාර්ගය සහ මාර්ග රක්ෂිතය ;
*නැගෙනහිරට* : නිවාසවල සිට විහාරය දක්වා දිවෙන මාර්ගය ;
*දකුණට* : ශාන්ත හිමිකම් කියන ඉඩම ;
*බටහිරට* : මහින්ද, ක්‍රිශාන්ත සහ සෝමසුන්දර හිමිකම් කියන ඉඩම්.

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය* :

01. පූජ්‍ය ගනේගොඩ ශ්‍රී සිද්ධාර්ථ ධම්මපාල රතනජෝති හිමි,
විහාරාධිපතීන් වහන්සේ,
නාගොල්ල පුරාණ රජමහා විහාරය,
පොල්පිතිගම.

02. මහාභාරකාර තුමා,
මහා භාරකාර දෙපාර්තමේන්තුව,
බුලර්ස් පාර,
කොළඹ 7.

07 - 812

---

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ, 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර නාගරික සංවර්ධන, ජල සම්පාදන හා නිවාස පහසුකම් අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මම, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ, බිංගිරිය උඩුබද්දාව ජල සම්පාදන ව්‍යාපෘතියේ, (අදියර I) උඩුබද්දාව වැඩභාර නිලධාරි කාර්යාලය ඉදි කිරීම සඳහා ඉඩම් කොටසක් අවශ්‍යව ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසෙහි නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මෙම නියමයෙන් අනුමත කරමි.

**මහින්ද රාජපක්ෂ,**
නාගරික සංවර්ධන, ජල සම්පාදන හා නිවාස පහසුකම් අමාත්‍ය.

2020 ජූලි මස 08 වැනි දින,
බත්තරමුල්ල,
පැලවත්ත,
නව පාර්ලිමේන්තු පාර,
අංක 35 හි පිහිටි,
නාගරික සංවර්ධන, ජල සම්පාදන හා නිවාස පහසුකම් අමාත්‍යාංශයේ දී ය.
5/3/KG/01

## උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 1504, ඉහළගම දකුණ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, උඩුබද්දාව - ඉහළගම ගමේ පිහිටි, බලයලත් මිනින්දෝරු ඇනස්ලි වී. ලියනගේ මහතා විසින් මැන සකස් කරන ලද අංක 5306 දරන මිනින්දෝරු සැලැස්මේ කැබලි අංක "A" වශයෙන් දක්වෙන "කෝන්ගහමුලහේන වත්ත" නමැති ඉඩමෙන් පහත සඳහන් මායිම තුළ පිහිටි පර්චස් 30ක් පමණ වන ඉඩම් කොටස :

කැබලි අක්ෂර : A
ඉඩමේ නම : කෝන්ගහමුලහේන වත්ත
ප්‍රමාණය : පර්චස් 30

මායිම්

*උතුරට* : බලයලත් මිනින්දෝරු එස්. එම්. දිසානායක මහතා විසින් මැන සකස් කරන ලද අංක 1543 දරන සැලැස්මේ කැබලි අංක 2 ;
*නැගෙනහිරට* : මෙම ඉඩමේ ඉතිරි කොටස කැබලි අංක "B" ;
*දකුණට* : කැබලි අංක "B" සඳහා ඇති ප්‍රවේශ මාර්ගය සහ පිඹුරු අංක 1543හි කැබලි අංක 4 ;
*බටහිරට* : උඩුබද්දාව - නාත්තන්ඩිය ප්‍රධාන මාර්ගය.

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය* : 01. ආර්. පී. ඉන්ද්‍රා පද්මලතා මහත්මිය,
නාත්තණ්ඩිය පාර,
උඩුබද්දාව.

07 - 813